ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් එකතුව රු.1,900,418 ක් වූ ඉදිකරමින් පවතින සේවා පියස් ගොඩනැගිලි 06 ක් කෙරිගෙන යන වැඩසටහන යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි, නේවාසික නොවන ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් මත ගිණුම්ගත කර ඇති බව දන්වා ඇත.	නිවැරදි වත්කම් බාණ්ඩය යටතේ ගිණුම් ගත කළ යුතුය.
(ii)	දැරණියගල ග්‍රාම නිලධාරි කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම රු 141,044 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	පිරිවැය ලෙස රු.1,961,044 ක් ලෙස ගිණුම්ගත කර ඇති අතර තක්සේරු වටිනාකම රු.1,820,000 ලෙස නිවැරදිව ගිණුම්ගත කිරීමට උපදෙස් ඉල්ලා ඇති බව දන්වා ඇත.	නිවැරදි වටිනාකම නිරූපණය වන පරිදි මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් සිදු කළ යුතුය.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මුදල් රෙගුලාසි 110 අනුව හානි ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිසි පරිදි පවත්වාගෙන යාමට උපදෙස් ලබාදී ඇත.	මුදල් රෙගුලාසි අනුව හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කළ යුතුය.
(ii)	2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 8.1 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීන කර නොතිබුණි.	ඉදිරියේදී කටයුතු කරන බව දන්වා ඇත.	ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීන නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව අදාළ ලේඛන යාවත්කාලීන කිරීමටත් කටයුතු කළ යුතුය.

(iii)	මුදල් රෙගුලාසි 388,389 හා 451 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව චෙක්පත් ලේඛනයේ චෙක්පත් භාරගත් අයගේ අත්සන් සහිතව එය යාවත්කාලීන කර නොතිබුණි.	චෙක්පත් ලබා ගැනීම ප්‍රමාද වී ඇති බව දන්වා ඇත.	මුදල් රෙගුලාසි අනුව චෙක්පත් ලේඛනය යාවත්කාලීන කළ යුතුය.

(ඇ) විගණන සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	පෙර වර්ෂය අවසානයේ තක්සේරු කරන ලද ගොඩනැගිලිවල වටිනාකම රු.436,636,000 වූ අතර, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ආරම්භක ශේෂය රු.1,194,862,188 ක් වීම හේතුවෙන් රු.758,226,188 ක වෙනසක් පැවති අතර එය තහවුරු කර ගැනීමට අදාළ උපලේඛන විගණනය වෙත ඉදිරිපත් නොවුණි.	2013 වර්ෂයේදී හා ඊට පසු වත්කම් තක්සේරු කිරීම් ,නව ඉදිකිරීම්වල පිරිවැය සිගාස් පද්ධතිය හරහා ගිණුම්ගත කර ඇති බව දන්වා ඇත .	සියළු වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කල යුතුවීම හා උපලේඛන යාවත්කාලීන කළ යුතුය.
(ii)	යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ඉඩම් වටිනාකම රු.17,700,000 ක් ලෙස ගිණුම් ගත කර තිබුණද, අයිතිය පිළිබඳ සනාථ කිරීම් නොතිබුණි.	අනු රේඛනය සඳහා පිඹුරක් නොමැති බව හා සිහි කැඳවීම් යොමු කර ඇති බව දන්වා ඇත.	විධිමත් පරිදි කටයුතු කර ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 1.6.3 (අ) (i), 1.6.3 (අ) (ii) හා 4.2 ඡේදවල නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශිය ලේකම් කාර්යාල 2 ක ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය වෙනුවෙන් ලැබී තිබූ රු.25,513,970 ක ඉඩම් වන්දි මුදල් අදාළ අරමුණ සඳහා වැය නොකිරීම හේතුවෙන් 2024 ජූලි 31 දින නැවත භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි.	භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් මත අතිරික්ත මුදල් ශේෂයන් ට අදාළව සතියක් ඇතුළත ගෙවීම් සඳහා ඉදිරිපත් නොවන ගෙවීම් සඳහා වූ මුදල් ප්‍රේෂණය කළ යුතු බව දන්වා ඇත.	අරමුණුගත කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ කාර්යය කඩිනම් කළ යුතුය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන සහ මූලධන වියදම් සඳහා ලබා දී තිබුණු රු.3,298,731,340 ක මුදල ප්‍රතිපාදනයෙන් රු.303,237,005 ක් හෙවත් සියයට 10 ක ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි. එසේම පුනරාවර්තන වැය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 96 ක් වියදම් වූ අතර, මූලධන වියදම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 43 ක් වී තිබුණි.	ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 අනුව සියයට 43 ක් ඉතිරි වීම් ඇති බව දන්වා ඇත.	ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කළ යුතු අතර, විධිමත් වැඩපිළිවෙලක් යටතේ ප්‍රතිපාදන පූර්ණ උපයෝජනය කළ යුතුය.
(ආ)	2024 වර්ෂයේ වැය විෂයයන් 27 කට අදාළ ප්‍රතිපාදනවලින් සියයට 11 සිට සියයට 89 දක්වා රු.203,277,929 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.	අයවැය චක්‍රලේඛ අංක 1/2024 අනුව වියදම් පාලනය කළ බව දන්වා ඇත.	- එම -

3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාල නව ගොඩනැඟිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් මුදල වූ රු.198,832,312 ක වටිනාකමින් සියයට 5 ක් එනම් රු.9,941,616 ක් උපදේශන ගාස්තුවෙන් තව දුරටත් ගෙවිය යුතු රු.1,270,041 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ බැඳීම් යටතේ හෙළිදරව් කර නොතිබුණි.	සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති අතර, උපදේශන ආයතනය මඟින් ඉල්ලීම් ඉදිරිපත් කිරීමෙන් පසු ගිණුම්වල දක්වන බව දන්වා ඇත.	මූල්‍ය ප්‍රකාශනවල සියළුම බැඳීම් හා බැරකම් හෙළිදරව් කළ යුතුය.

3.5 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් පාසල් ක්‍රිකට් සංවර්ධන වැඩසටහන යටතේ නව පැති විකට් ඉදිකිරීම වෙනුවෙන් රු.15,507,106 ප්‍රතිපාදනය වෙන්කර තිබූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති දුර්වලතා හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වනවිටත් පාසල් 02 ක් සඳහා රු.2,182,347 ක් පමණක් වැයකර රු.13,324,759 ක් ආපසු පවරා දීමට කටයුතු කර තිබූ හෙයින් වැඩසටහනේ අපේක්ෂිත අරමුණ ඉටුව නොතිබුණි.	නිසි ප්‍රගතිය අත්කර නොතිබීම, කොන්ත්‍රාත්කරු ඉංජිනේරු උපදෙස් පිළිබඳ සැලකිලිමත් නොවීම ,වැසි සහිත කාලගුණය පැවතීම,ව්‍යාපෘතිය අවිච්ඡේද කරන ලෙස ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම වැනි හේතු බලපෑ බව දන්වා ඇත.	කාර්යක්ෂමව කටයුතු කර ප්‍රතිපාදන යෝජිත අරමුණට යෙදවීමට කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, ලබා දී ඇති ප්‍රතිපාදන සැලසුම්ගත කාර්යයන්ට කාලීනව යෙදවීමත් කළ යුතුය.

(ආ)	සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය මගින් දැදිගම රජ මහ විහාරයේ රථගාල සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,083,110 ක කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද, 2024 ඔක්තෝබර් 28 දින වනවිටත් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබීම හේතුවෙන් ප්‍රතිපාදනය ආපසු පවරා දීමට කටයුතු කර තිබුණි.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කිරීම වැනි හේතු මත ප්‍රතිපාදන නැවත භාරදී ඇතිබව දන්වා ඇත .	- එම -
(ඇ)	කෘෂිකර්ම නවීකරණ වැඩසටහන යටතේ විවිධ කෘෂි ව්‍යාපෘති සඳහා 2024 අගෝස්තු මස වෙන් කර තිබූ ප්‍රතිපාදන අතුරින් රු.7,473,407 ක් ව්‍යාපෘති සඳහා වැය නොකර ආපසු පවරාදීමට කටයුතු කර තිබුණි.	ප්‍රතිලාභීන් සියයට 50 මූල්‍ය දායකත්වය ලබා දීමට අකමැත්ත ප්‍රකාශ කිරීම මගින් ආරම්භක වැඩසටහනක් වීම නිසා මැතිවරණ කාලය තුළ ව්‍යාපෘතිය කිරීමට නොහැකි වීම එම ප්‍රසම්පාදන කටයුතු සඳහා කාලය අවම වීම වැනි කරුණු මත ප්‍රතිපාදන ආපසු පවරා ඇති බව දන්වා ඇත.	- එම -

3.6 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී කටයුතු කරන බව දන්වා ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම.

3.7 අවිධිමත් ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	"රුකාෂල්" කම්බි පාලම අළුත්වැඩියාකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් දෙහිඕවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය 2024 අගෝස්තු 12 දින අනුමත සමිතියක් සමඟ ගිවිසුම් ගත වි	විමර්ශනය සිදුකල වාර්තාව ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත.	විධිමත් පරීක්ෂණයක් සිදු කර අවිධිමත් ගනුදෙනුව සඳහා සම්බන්ධ පාර්ශව සම්බන්ධයෙන් විධිමත්

	තිබුණු අතර අදාළ සමිතිය ගිවිසුම උල්ලංඝනය කරමින් ව්‍යාපෘතිය උප කොන්ත්‍රාත් ලබාදී තිබුණි. 2024 දෙසැම්බර් 31 දින අළුත්වැඩියා කිරීම් කටයුතු ආරම්භකර හෝ නොමැතිව තිබිය දී වැඩ අවසන් බවට දක්වා රු.2,940,903 ක් ගෙවීම් කර තිබුණි.		පරිදි කටයුතු කළ යුතුය.
(ආ)	දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සෙවිලි තහඩු 1904 ක් මිළදි ගැනීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරිම හා විශේෂ සන්නාමයක් යටතේ මිළ දී ගැනිම හේතුවෙන් රු.2,779,840 ක අලාභයක් සිදුව තිබුණි.	ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිළ කැඳවීම් සිදුකල බවත් පිරිවිතර හඳුනාගැනීමේ ගැටළු නොපැවති බවත් දන්වා ඇත.	විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාළ පාර්ශව වෙතින් අලාභය පියවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2009 වර්ෂයේදී පිරිනමා තිබුණු අතර 2024 නොවැම්බර් වන විට ඒ වෙනුවෙන් රු.171,030,580 ක වියදමක් දරා තිබුණු නමුත් ඇස්මේන්තු කර නොතිබුණු වැඩ විෂයන් 04 ක් වෙනුවෙන් රු.16,809,560 ක ගෙවීමක් සිදුකර තිබුණි. තවද එහි ඉදිකිරිම් දිගින් දිගටම ප්‍රමාද වීම මත 2023 දෙසැම්බර් 31 දින වන විට මිල විචලන ගැලපීම සඳහා රු.48,414,633 ක මුදලක් ගෙවීමට සිදුව පැවතුණි.	සමස්ථ ඇස්තමේන්තු සකස් කර නොමැති බවත්, අදාළ අඩුපාඩු සකස් කරමින් පවතින බවත් දන්වා ඇත.	විධිමත් අධීක්ෂණයක් හා නියාමනයක් සිදු කර සැලසුම්ගත පරිදි කාලීනව ඉදි කිරීම් කටයුතු නිම කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.

3.8 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 න් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) අනුව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වූවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අත්තිකාරම් ලේඛනය අනුව නිලධාරීන්ට අවස්ථා 15 කදී ලබා දී තිබුණු එකතුව රු.219,040 ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 11 සිට දින 34 ක් දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.	ප්‍රමාදවීම් සිදුවී ඇති අතර, ඉදිරියේදී නියමිත පරිදි කටයුතු කිරිමට උපදෙස් ලබාදී ඇත.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවීම හා නියමිත කාල සීමාව තුළ අත්තිකාරම් පියවන බව තහවුරු වන අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දිමට කටයුතු කළ යුතුය.

3.9 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශිය ලේකම් කාර්යාල 10 ක ඉඩම් අත්පත් කර ගැනිමේ කටයුතු සඳහා 2023 වර්ෂයට පෙර ලැබී තිබූ තැන්පතු මුදල් රු.43,732,215 ක් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබූ අතර, ලද මුදල් වෙනත් කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කර තිබුණි.	අත්පත් කර ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත.	ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කර තැන්පත් ගිණුමේ රඳවා නොගෙන අදාළ මුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය.
(ආ)	රුවන්වැල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක වන වැඩසටහන් 2 ක් වෙනුවෙන් 2024 අගෝස්තු 29 දින රු.800,000 ක මුදලක් ලැබී තිබුණු අතර, 2025 මාර්තු 05 දින වනවිටත් රු.402,445 ක මුදලක් වියදම් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.	භාණ්ඩ අදාළ ප්‍රතිලාභින් වෙත ලබාදීමට කටයුතු කර ඇත.	අරමුණුගත කාර්ය සඳහා ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, ප්‍රතිපාදන උපයෝගී කරගෙන ප්‍රතිලාභ ලබා දීමටත් කටයුතු කළ යුතුය.

3.10 වත්කම් සමීක්ෂණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉඩම්වල වටිනාකම රු.144,350,000 ක් ලෙස මූල්‍යය ප්‍රකාශන වල දක්වා තිබුණද, මූල්‍ය නොවන වත්කම් සමීක්ෂණයක් සිදුකර නොතිබුණ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි වටිනාකම රු.380,643,834 ක් ලෙස මූල්‍යය ප්‍රකාශන වල දක්වා තිබුණ ද ස්ථාවර වත්කම් සමීක්ෂණයට ලක්ව තිබූ ගොඩනැගිලි හා ඉදිකිරීම් 06 ක පමණක් වටිනාකම රු.396,263,571 ක් විය.	ඉදිරියේදි කටයුතු කරන බව දන්වා ඇත.	ස්ථාවර වත්කම්වල පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකර අදාළ වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලටද ගැලපිය යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	උරුමය වැඩසටහන සඳහා ලද ප්‍රතිපාදන රු. 10,815,081 කින් රු 8,547,371 මූලධන වියදම් ලෙස ද රු.1,712,714 ක් පුනරාවර්තන වියදම් ද වශයෙන් එකතුව රු.10,260,085 ක් වැයකර තිබුණ ද දීමනාපත්‍ර හා බලපත්‍ර 753 ක් සඳහා පමණක් ඔප්පු ලබාදී තිබුණි.මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ඔප්පු බෙදාදීමට කටයුතු නොකර ප්‍රතිලාභීන් දඹුල්ල හා රුවන්වැල්ලට ප්‍රවාහනය කිරීම වෙනුවෙන් බස් රථ සඳහා රු.1,900,185 ක වියදමක්ද, ශබ්ද විකාශන යන්ත්‍ර ගාස්තු හා විදුලි සැපයුම් ගාස්තු ලෙස රු.803,023 ක මුදලක් ද දරා තිබුණි.	ඉඩම් කොමසාරිස් කාර්යාලය හරහා ඔප්පු ලැබීමේ ප්‍රමාදය උරුමය වැඩසටහන තාවකාලිකව නතර වීම මේ සඳහා හේතු වී ඇති බවත් ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බවත් දන්වා ඇත.	ඉඩම් කොමසාරිස් කාර්යාලය හා සම්බන්ධ වී වැඩසටහන කඩිනමින් නිම කිරීමටත්, දරා ඇති අතිරේක වියදම් පිළිබඳ විධිමත් පරීක්ෂාවක් සිදු කර අවිධිමත් ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත පියවර ගැනීමත් කළ යුතුය.
(ආ)	විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් අයකර ගැනීම සඳහා නව තොරතුරු පද්ධතියක් හඳුන්වා දී තිබුණද, දිස්ත්‍රික්කයේ විශ්‍රාම වැටුප් ලෙස වැඩිපුර ගෙවූ රු.16,179,701 ක මුදලක් 2024 දෙසැම්බර් 31 වනවිට තවදුරටත් අයකළ යුතුව පැවතුණි.	ඉදිරියේදී අයකිරීමට කටයුතු කරන බව දන්වා ඇත.	විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවීම් සඳහා නිලධාරීන් සම්බන්ධ වී තිබේ නම්, ඔවුන්ට විධිමත් පියවර ගැනීමටත්, චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු 45 ක් මඟින් ලබාදී තිබූ ණය වලින් 2024 දෙසැම්බර් 31 දිනට රු.302,985,381 ක බොල් ණය පැවතුණි 2024 වර්ෂය තුළ සමස්ථ අයවීම් ප්‍රතිශතය සියයට 8.63 ක් වූවද, බැංකු 27 ක අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 1.42 සිට 8.33 ක අඩු පරාසයක පැවතුණි.	එක් එක් ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති මට්ටමින් වෙනත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ණය අයකර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා ඇත.	ණය ශේෂ කාලීනව අයකර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, බොල් ණය අවම වන පරිදි ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට හා ණය අයකර ගැනීම කඩිනම් කිරීමත් කළ යුතුය.
(ඈ)	රුවන්වැල්ල හා බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නායයෑමෙන් අවතැන්වූ පුද්ගලයින් වෙත නැවත පදිංචියට රු.39,396,000 ක මුදලක් කොටස් වශයෙන් ගෙවීම් කර තිබුණද, යෝග්‍යතා සහතික නිකුත් කර, පදිංචි වීමට කටයුතු කර නොමැති බැවින් එම වැයකල මුදලෙහි කාර්යසාධනය අඩු මට්ටමක පැවතුණි.	අමාත්‍යාංශය මඟින් ලබා දී ඇති උපදෙස් අනුව 2022.12.21 දිනයෙන් පසුව 2016 වර්ෂයේ නැවත පදිංචි කිරීමේ වැඩසටහන අවසන් කිරීම හේතුවෙන් ඔවුන් නැවත වැඩ අවසන් කළ ද එම මුදල් ගෙවීමට හැකියාවක් නොමැති වනු ඇති බව දන්වා ඇත.	විධිමත් අධීක්ෂණයක් හා පසු විපරම් ක්‍රියා මාර්ග දැඩිකර අරමුණුගත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙලක් සකසා නැවත පදිංචි කිරීමේ කටයුතු නිමකළ යුතුය.

4.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.183,225,195 ක් වැය කර තිබුණද, ඉදිකිරීම් ප්‍රගතිය සියයට 88 ක් වීමෙන් අපේක්ෂිත අරමුණ මේ දක්වාම ඉටුකර ගැනීමට නොහැකිව පැවතුණි.	ප්‍රධාන ඉංජිනේරු හා කාර්මික නිළධාරි සිදුකල පරික්ෂාකිරීම්වලින් අනතුරුව අඩුපාඩු සකස් කරමින් පවතින බව දන්වා ඇත.	කඩිනම් වැඩපිළිවෙලක් යොදා ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	බුලත්කොහුපිටිය හා දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට රු.මිලියන 204.48 ක් වැයකර තිබූ අතර, නිවැරදිව සැලසුම් සකස් නොකිරීම මත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගත් අඩුපාඩු 2025 මැයි මස වනවිටත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	සමස්ථ ඇස්තමේන්තු සකස්කර නොමැති බවත් අදාළ අඩුපාඩු සකස් කරමින් පවතින බවත් දන්වා ඇත.	- එම -

4.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ග්‍රාම ශක්ති ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය තුළ පිහිටුවා තිබුණු සමිති 130 න් 2024 දෙසැම්බර් වන විට සමිති 120 ක ගිණුම්වල පැවැති රු.115,459,975 ක ශේෂය අදාළ අරමුණ කරා ඵලදායිව යොදා ගැනීමට කටයුතු නොකර අක්‍රියව පැවතුණි.	පොදු තැම්පත් ගිණුමට තැම්පත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනිම සඳහා ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව සහ වැඩසටහන මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතින බව දන්වා ඇත.	විධිමත් වැඩපිළිවෙලක් යොදා අරමුණුගත කණ්ඩායම් නිවැරදිව ආකර්ශනය වන ලෙස ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු අතර, එසේ නොමැති නම් විධිමත්ව කටයුතු කර රජයට පවරා ගැනීම කළ යුතුය.
(ආ)	වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැසිකිළි නොමැති අය සඳහා වැසිකිළි ආධාර ලබාදීම හා නිවාස ආධාරය ලබාදීම වෙනුවෙන් 2024 අප්‍රේල් 18 දින රු.3,000,000 ක ප්‍රතිපාදන හා නිවාස වල ඉතිරි වැඩ නිමකිරීමට 2024 සැප්තැම්බර් 02 රු.6,000,000 ක් ලැබී තිබුණද, 2024 දෙසැම්බර් 03 දිනවන විටත් ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.	ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබුණු බවත් නිවාස ඉදිකිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදුන් බවත් දන්වා ඇත.	ප්‍රතිපාදන කාර්යක්ෂමව ප්‍රදේශයේ සංවර්ධනයට යොමු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, විධිමත් වැඩපිළිවෙලක් යටතේ ව්‍යාපෘතිය සඳහා ලද මුදල් අදාළ අරමුණ වෙනුවෙන් උපයෝජනය කිරීමත් කළ යුතුය.

(ඇ)	රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨසයේ දොරණුව ග්‍රාම සංවර්ධන ගොඩනැගිල්ල තේ කොළ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වසර 08 කට පෙර ආරම්භකර තිබූ අතර ඒ වෙනුවෙන් රු.2,890,000 ක් වැයකර තිබුණද, විගණිත දිනය වූ 2025 ජනවාරි 20 දින වනවිටත්, අර්ධ නිමි ගොඩනැගිල්ලක් බවට නිරීක්ෂණය විය.	ඉතිරි වැඩ නිම කිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ඇති බව දන්වා ඇත.	විධිමත් පරිදි කටයුතු කර අරමුණු ඉටුවන පරිදි ප්‍රතිපාදන ලබාගෙන ඉදි කිරීම් නිම කරවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය.

4.4 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ලෙවන්ගම ටැම්පිට විහාරය සංරක්ෂණය කිරීම සඳහා රු.1,326,312 ක ඇස්තමේන්තුවක් සකස් කර වටිනාකම රු.1,226,020 ක ද්‍රව්‍ය 2024 දෙසැම්බර් 31 දින වනවිට මිලදීගෙන තිබුණද, 2025 ජනවාරි 17 භෞතික පරීක්ෂණ දින වනවිටත් එහි ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි.	ලී තොගය පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ, ආරක්ෂාකාරීව ගබඩා කර ඇති බවත් කඩිනමින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු සිදු කරන බව පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දී ඇතිබව දන්වා ඇත.	විධිමත් අධීක්ෂණයක් හා පසු විපරම් සිදු කර කඩිනමින් ව්‍යාපෘතිය නිම කරවා ගත යුතුය.
(ආ)	රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වරාවල වැකඩ පානීය ජල දිගුව ඉදිකිරීම මගින් පවුල් 300 ක් සඳහා ජලය ලබාදීමට මූලික අදියර වශයෙන් කානු කපා නල පද්ධතිය ඉදිකර ජලය ලබාදීම වෙනුවෙන් රැඳවුම් මුදලක් රඳවා නොගෙන මුළු වටිනාකම වූ රු.21,500,000 ක මුදලක් ජල සම්පාදන මණ්ඩලයට ගෙවා තිබුණද 2025 ජනවාරි 17 දින වනවිටත් ව්‍යාපෘතියේ ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි.	ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය කඩිනමින් ලබාදෙන බව දන්වා ඇත.	- එම -

4.5 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව වැය විෂයන් 04 ක් සඳහා රු.295,100,000 ක ප්‍රතිපාදනයෙන් රු.124,741,973 ක් වියදම් දරා තිබුණු බැවින් ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රගතිය සියයට 43 ක් වැනි අවම අගයක පැවතුණු අතර ප්‍රධාන	වියදම් පාලනය හා නව ව්‍යාපෘති ආරම්භකිරිමට තරම් ප්‍රමාණවත් කාලයක් නොතිබීම හේතු ලෙස දන්වා ඇත.	ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදිව සකස් කිරීමත්, ප්‍රසම්පාදන සැලැස්මට අනුව කාලීනව කටයුතු කිරීමත් කළ යුතුය.

ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරිමට කටයුතු කර නොතිබුණි.

4.6 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක අඩක් නිමකල සේවා පියස් 19 ක් වසර 01 සිට 10 දක්වා කාලයක් අභාවිතව පැවතීම නිසා ඒ වෙනුවෙන් වැය කළ රු.13,398,639 ක වියදම් අනාර්ථික වී තිබුණි.	ප්‍රතිපාදන ඉල්ලුම්කර ඇති බව දන්වා ඇත.	විධිමත් පරිදි ප්‍රතිපාදන ලබාගෙන ඉදි කිරීම් නිම කරවා නිෂ්කාර්ය වත්කම් උපයෝජනයට කටයුතු කළ යුතුය.
(ආ)	අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කුළුබඩු නිෂ්පාදන ගම්මානය සඳහා අමුද්‍රව්‍ය එක් රැස්කරන මධ්‍යස්ථානය ලෙස ගොඩනැගිල්ලක් සංවර්ධනය කිරිම වෙනුවෙන් රු.2,062,000 ක් වැයකර තිබුණ ද විගණිත දින වන 2025 මාර්තු 08 වනවිටත් එම ගොඩනැගිල්ල උපයෝජනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රතිලාභීන් විසින් තමාට අයත් ස්ථාන තුලම කුළුබඩු නිෂ්පාදන කටයුතු සිදු කර අලෙවි කරන බැවින් ගොඩනැගිල්ල සෞභාග්‍යා නිෂ්පාදන කාර්යංශයේ එකඟතාවය සහිතව වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත.	විධිමත් අධ්‍යයනයක් හා අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව ව්‍යාපෘති තෝරාගත් නිලධාරීන්ට පියවර ගැනීමත්, අදාළ ආයතන සමඟ සම්බන්ධ වී ඵලදායී කාර්යයක් සඳහා ගොඩනැගිල්ල යෙදවීමටත් පියවර ගත යුතුය.
(ඇ)	කෑගල්ල දීවෙල වසමේ 2018 වර්ෂයේ ආරම්භ කළ ජල ව්‍යාපෘතියක් ඉදිකිරිම් අත්හැර දැමීම නිසා රු.1,733,622 ක් වැයකර ඉදිකළ ජල ටැංකිය අභාවිතව පැවතුණි.	තෙකලා විදුලිය ලබා ගැනීමේ ගැටළුව හා ප්‍රතිපාදන ඌනතාවය නිසා තාවකාලිකව ව්‍යාපෘතියේ කටයුතු නතර වී ඇත.	පවතින ගැටළු සඳහා කඩිනමින් පිළියම් යොදා ව්‍යාපෘතිය නිම කිරීමට පියවර ගත යුතුය.

4.7 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පැවැත්වූ ඉඩම් කච්චේරි වලට අදාළව ඉඩම් කොමසාරිස් ජනරාල්, පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කර තිබූ කෘෂිකාර්මික කටයුතු, නේවාසික කටයුතු, වාණිජ කටයුතු වෙනුවෙන් දීර්ඝකාලීන බදු දීමට අදාළ ප්‍රතිලාභීන් 104 කගේ ගොණු කටයුතු අවසන් කර නොතිබුණි.	පවත්වන ලද සියලුම ඉඩම් කච්චේරි මගින් හඳුනා ගන්නා ලද ගැටළුවලට ඉදිරි කටයුතු කරගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත.	දීර්ඝ කාලීන ප්‍රමාදයට හේතු අනාවරණය කර ගැනීමට කටයුතු කර ඊට පිළියම් යොදා බලපත්‍ර හා දීමනාපත්‍ර බෙදාදීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11 ක වසා දමා තිබූ පාසල් 98 ක් අතුරින් පාසල් 29 ක භූමිය සහ ගොඩනැගිල්ල ඌණ උපයෝජිතව පැවතුණි.	ඌණ උපයෝජිත පාසල් ඵලදායී කාර්යයන් වෙනුවෙන් තවදුරටත් යෙදවීමට පවතින බව දන්වා ඇත.	විධිමත් පරිදි කටයුතු කර ඌණ උපයෝජිත පාසල් ඵලදායී කාර්යයන් වෙනුවෙන් යෙදවීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක දීර්ඝකාලීන බදු පදනම යටතේ බදු දී ඇති ඉඩම් සහ වෙනත් දේපල වලින් 1997 සිට 2024 දක්වා වූ කාල පරාසය තුළ රු.19,539,297 ක අයවිය යුතු බදු මුදලක් පැවතුණි.	තවදුරටත් අයවීමට පවතින බදුදේපල පවතින බව දන්වා ඇත.	කාලීනව බදු මුදල් අය කිරීමට කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, දීර්ඝ කාලීන හිඟ බදු කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඈ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක නොදියුණු වටිනාකම ගෙවා ඉඩම් අත්පත් කර ගැනීම් වලට අදාළව ප්‍රතිලාභීන් 13 දෙනෙකුගෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට රු.6,080,720 ක හිඟ මුදලක් අයවීමට පැවතුණි.	අයවීමට හිඟ මුදල් පවතින බවත් අයකර ගැනීමට අදාළ පාර්ශව දැනුවත් කළ බවත් දන්වා ඇත.	කාලීනව හිඟ බදු අය කිරීමට පියවර නොගත් නිලධාරීන්ට පියවර ගැනීමටත්, නොදියුණු වටිනාකම් මත ගෙවා ලබා දී තිබූ ඉඩම්වලට අදාල හිඟ බදු කඩිනමින් අයකර ගැනිමටත් කටයුතු කළ යුතුය.

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ 2024 වර්ෂයට අනුව ළඟා කර ගත යුතු හා ඉලක්ක කර ළඟා වීමේ සූදානම පිළිබඳ පරීක්ෂාවේදී, තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ට අනුව අරමුණු 13 ක් හඳුනාගෙන තිබුණද, තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව අරමුණු 04 ක් කෙරෙහි නිසි අවධානය යොමු කර නොතිබුණි.	2025 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මත කිරීමේ දී මෙම තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව අරමුණු 17 සඳහාම තොරතුරු ලබා ගෙන කාර්ය සාධන වාර්තාව සකස් කරන බව දන්වා ඇත.	තිරසාර සංවර්ධන අරමුණුවලට ලඟාවීමෙන් ප්‍රගතිය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	කාර්යය සාධන වාර්තාව අනුව තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනිමේ ජයග්‍රහණ දර්ශක හඳුනාගෙන තිබුණ ද 2024 වර්ෂයේ සම්පත් පැතිකඩ අනුව තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම අවම මට්ටමක පැවතුණි.	පලමු කාර්තුවේ පමණක් ප්‍රතිපාදන ලැබුණද සංවර්ධන ව්‍යාපෘති බොහොමයක් ක්‍රියාත්මක නොවීමත්, අනෙකුත් රාජ්‍ය ආයතන වලින් තොරතුරු ලැබීම අවම මට්ටමක තිබීම හේතුවෙන් තිරසර සංවර්ධන අරමුණු වලට ළඟා වීම අවම ප්‍රගතියක් පැවතුන බව දක්වා ඇත.	ප්‍රගතිය අඩු තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒ සඳහා ඵලදායි ක්‍රමවේද ක්‍රියාත්මක කළ යුතුය.

6. යහපාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 මාර්තු 21 දිනැති අංක 02/2018 (i) චක්‍රලේඛයේ 04 ඡේදය පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සේවා ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් සිටින මහජනතාව වෙතින් ලැබෙන පැමිණිලි සඳහා විසඳුම් ලබාදීමට සුදුසු යාන්ත්‍රණයක් ගොඩනැගීමට ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.	පැමිණිලි ලේඛනය පැවතුනද නිසි ක්‍රමවේදයන් යටතේ නඩත්තු නොවන බව දන්වා ඇත.	විධිමත් අධීක්ෂණයක් සිදු කර මහජනතාවගේ පැමිණිලි සඳහා විසඳුම් ලබා දීමේ යාන්ත්‍රණයක් සකස් කර මහජන සේවා ඉටුකිරීමට ප්‍රමුඛත්වයක් දී කටයුතු කළ යුතුය.

7. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 244 උප ඡේදය පරිදි සෑම නිලධාරියෙකුම ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතු වුවද නිලධාරීන් 512 දෙනෙකු 1995 වර්ෂයේ සිට එසේ මාරුකිරිමට කටයුතු සිදුකර නොතිබුණි.	අභ්‍යන්තර ස්ථාන මාරුවීම් හා ඒකාබද්ධ සේවා ස්ථාන මාරු ක්‍රියාත්මක නොවීම් පැවති බව දන්වා ඇත.	ස්ථාන මාරුවීම් පටිපාටි විධිමත් කර කාර්ය පටිපාටික රීති අනුව කටයුතු කළ යුතුය.